**THE OPEN UNIVERSITY OF SRI LANKA**
**BACHELOR OF EDUCATION (NATURAL SCIENCE)**
**DEGREE - LEVEL 5**
**FINAL EXAMINATION 2006**
**ESU 3118 – PRIMARY EDUCATION**

**DURATION : THREE (03) HOURS**

**DATE : 29.07. 2006** **TIME: 9.30 a.m. – 12.30 p.m.**

LIBRARY

ANSWER ALL THE QUESTIONS IN PART I AND ANY THREE QUESTIONS FROM PART II.

## PART I

01. Write the views of a philosopher who has influenced the curriculum of the Primary School.

02. Explain citing examples two measures taken by the state to guarantee the right to participation of Sri Lankan children.

03. State briefly the changes brought about in Primary School curriculum n Sri Lanka introduced in 1972.

04. i. Name three techniques adopted by young children to learn.

    ii. Select any one(01) from the techniques you have mentioned above and briefly explain how children in the key stage 1 adopt this technique to learn.

05. State the five (05) basic competencies the child is expected to acquire during the primary school stage, according to the Educational Reforms that are being implemented to day in Sri Lanka.

06. State three (03) tasks a primary school teacher should perform in order to establish a sustaining school-home linkage.

07. Critically examine two (02) features of the assessment procedures presently adopted in Sri Lankan primary schools.

08. i. Name four (04) officials in the category of 'Supervisory Personnel' responsible for the provision of primary education in Sri Lanka.

    ii. Briefly explain the responsibilities of 'supervisory personnel' in the provision of primary education in Sri Lanka.

(8x5=40 marks)

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා) උපාධිය

අවසාන පරීක්ෂණය 2006

ප්‍රාථමික අධ්‍යාපනය - **ESU 3118**

කාලය - පැය තුනයි.

---

දිනය - 2006.07.29 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30

---

**I** වන කොටසේ සියළුම ප්‍රශ්නවලටත් **II** කොටසින් ඕනෑම ප්‍රශ්න තුනකටත් පිළිතුරු සපයන්න.

## I - කොටස

01. ප්‍රාථමික පාසල් විෂයමාලාව කෙරේ බලපා ඇති දාර්ශනිකයකුගේ අදහස් ලියන්න.

02. ශ්‍රී ලංකාවේ ළමයින්ගේ සහභාගිත්වය සඳහා අයිතිය සහතික කිරීමට, රජය විසින් ගෙන ඇති උපාය මාර්ග දෙකක් (02) නිදසුන් සහිතව පැහැදිලි කරන්න.

03. 1972 දී හඳුන්වා දුන්, ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල් විෂයමාලාවේ ඇති කරන ලද වෙනස්වීම් කෙටියෙන් දක්වන්න.

04. **i.** බාලවියේ ළමයින් ඉගෙනුම සඳහා භාවිත කරනු ලබන ශිල්පීය ක්‍රම තුනක් (03) නම් කරන්න.

    **ii.** ඔබ සඳහන් කරන ලද ශිල්පීය ක්‍රම අතරින් එකක් තෝරාගෙන, පළමු ප්‍රධාන අවධියේ ළමයින්, ඉගෙනුම සඳහා මෙම ශිල්පීය ක්‍රමය භාවිත කරනු ලබන්නේ කෙසේදැයි කෙටියෙන් පැහැදිලි කරන්න.

05. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව ළමයා විසින් ප්‍රාථමික පාසල් අවධියේ දී අත්පත් කර ගත යුතු යයි අපේක්ෂා කරනු ලබන මූලික නිපුණතා පහ (05) දක්වන්න.

06. පාසලත් නිවසත් අතර ස්ථිර සබඳතාවක් ස්ථාපිත කිරීම සඳහා ප්‍රාථමික ගුරුවරයකු විසින් ඉටුකළ යුතු කාර්යයන් තුනක් (03) දක්වන්න.

07. ශ්‍රී ලංකාවේ ප්‍රාථමික පාසල්වල වර්තමානයේ භාවිත කරනු ලබන තක්සේරුකරණ ක්‍රියාමාර්ගයන්ගේ ලක්ෂණ දෙකක් විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

08. **i.** ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් සේවය සලසන "අධීක්ෂණ කාරක මණ්ඩලයට" **(supervisory personnel)** අයත් නිලධාරීන් හතර දෙනෙකු නම් කරන්න.

    **ii.** ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය සම්බන්ධයෙන් සේවය සැලසීමේදී 'අධීක්ෂණ කාරක මණ්ඩලයට' අයත් වගකීම් සැකෙවින් පැහැදිලි කරන්න.

## PART II

09. Examine the contribution made by UNESCO to strengthen primary education.

(20 marks)

10. "There is a pressing need to bring about progressive changes in primary teacher education and training".

    i. Describe the measures taken by the government of Sri Lanka to train primary teachers.

    (12 marks)

    ii. Discuss the short comings of these measures.

    (08 marks)

11. Critically examine the following aspects of Primary Education Reforms of 1997.

    i. The quality of curricular materials
    ii. The quality of infrastructure provision.
    iii. The teaching learning process.

    (20 marks)

12. Assume that you are teaching key stage I children in your school.

    i. Write a brief report on developmental characteristics of your children.

    (12 marks)

    ii. Explain how you would use your knowledge about these characteristics to facilitate their learning in the classroom.

    (08 marks)

13. "The Primary School Teacher needs to be mindful of creating a conducive social climate that promotes learning in the primary school children"

    i. Explain the methods you can use to provide a conducive social climate in the key stage II classroom.

    (10 marks)

    ii. Describe the problems you may encounter when providing such an environment in your classroom.

    (10 marks)

14. Write short notes on any two of the following topics.

    i. Management of the Primary Curriculum.
    ii. New trends in Assessments.
    iii. The role of the principal in implementing the primary school curriculum.

*-Copyrights reserved -*

LIBRARY

## II- කොටස

09. ප්‍රාථමික අධ්‍යාපනය ශක්තිමත් කිරීම සඳහා යුනෙස්කෝ (UNESCO) සංවිධානයේ දායකත්වය පරීක්ෂා කරන්න.

10. 'ප්‍රාථමික ගුරු අධ්‍යාපනය හා ගුරු පුහුණුව පිළිබඳව ප්‍රගතිශීලී වෙනස්වීම්, ඇති කිරීමේ බලවත් අවශ්‍යතාවක් ඇත.'

    i. ප්‍රාථමික ගුරුවරුන් පුහුණු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ රජය ගෙන ඇති උපාය මාර්ග විස්තර කරන්න.

    ii. මෙම උපාය මාර්ගයන්ගේ අඩුපාඩු සාකච්ඡා කරන්න.

11. 1997 ප්‍රාථමික අධ්‍යාපන ප්‍රතිසංස්කරණවල පහත සඳහන් අංශ විවේචනාත්මකව පරීක්ෂා කරන්න.

    i. විෂයමාලා ද්‍රව්‍යයන්හි ගුණාත්මකභාවය.
    ii. යටිතල පහසුකම්වල ගුණාත්මක භාවය
    iii ඉගැන්වීම් - ඉගෙනුම් ක්‍රියාවලිය

12. ඔබගේ පාසලේ පළමු ප්‍රධාන අවධියේ ළමයින්ට ඔබ උගන්වන්නේ යයි සලකා,

    i. එම ළමයින්ගේ සංවර්ධන ලක්ෂණ පිළිබඳ කෙටි වාර්තාවක් සකස් කරන්න.

    ii. පන්ති කාමරය තුළ ළමයින්ගේ ඉගෙනීම පහසු කිරීමට ළමයින්ගේ සංවර්ධන ලක්ෂණ පිළිබඳ ඔබගේ දැනුම ප්‍රයෝජනයට ගන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

13. "ප්‍රාථමික පාසල් ළමයින් ඉගෙනීමට පොළඹවන යහපත් සමාජයීය වාතාවරණයක් ඇති කිරීම පිළිබඳව ප්‍රාථමික පාසල් ගුරුවරයා සැලිකිලිමත්වීම අවශ්‍ය වේ."

    i. දෙවන ප්‍රධාන අවධියේ පන්ති කාමරයක් තුළ යහපත් සමාජයීය වාතාවරණයක් ඇති කිරීම සඳහා ඔබට යොදාගත හැකි ක්‍රම පැහැදිලි කරන්න.

    ii. ඔබගේ පන්ති කාමරය තුළ එවැනි වාතාවරණයක් ඇති කිරීමේ දී ඔබට මුහුණදීමට සිදුවිය හැකි ගැටළු විස්තර කරන්න.

14. පහත සඳහන් මාතෘකාවලින් දෙකක් පිළිබඳව කෙටි සටහන් ලියන්න.

    1. ප්‍රාථමික විෂයමාලා කළමනාකරණය.
    2. තක්සේරුකරණයේ නව ප්‍රවණතා
    3. ප්‍රාථමික පාසල් විෂයමාලාව ක්‍රියාත්මක කිරීමේදී විදුහල්පති වරයාගේ භූමිකාව.

\- හිමිකම් ඇවිරිණි. -